එකිනෙක ඡේදනය නොවේ. මේ අනුව PQ සහ RS සමාන්තර සරල රේඛා ඛණ්ඩ වන අතර, AB සහ CD සරල රේඛා ඛණ්ඩ සමාන්තර නොවේ.

PQ සහ RS සරල රේඛා ඛණ්ඩ සමාන්තර බව "$PQ // RS$" ලෙස දක්වනු ලැබේ.

7.3 ලම්බ දුර

• යම් ලක්ෂ්‍යයක සිට සරල රේඛාවකට ලම්බ දුර

පහත රූපයෙන් දැක්වෙන්නේ විහිත චතුරස්‍ර වේ. විහිත චතුරස්‍රය භාවිත කර යම් ලක්ෂ්‍යයක සිට සරල රේඛාවකට ඇති ලම්බ දුර සොයන්නේ කෙසේ දැයි විමසා බලමු.



ක්‍රියාකාරකම 2

(1) සරල රේඛාවක් ඇඳ, එය l ලෙස නම් කර, l මත නොපිහිටි P ලක්ෂ්‍යයක් ලකුණු කරන්න.



(2) රූපයේ දැක්වෙන පරිදි විහිත චතුරස්‍රයේ සෘජු කෝණය සහිත එක් දාරයක් l සරල රේඛාව මත පිහිටන සේත් අනෙක් දාරය P ලක්ෂ්‍යය හරහා යන පරිදිත් විහිත චතුරස්‍රය පිහිටුවන්න.



(3) අනතුරුව l සරල රේඛාව මත A ලක්ෂ්‍යය ලකුණු කර AP යා කරන්න.

Aහි ලකුණු කර ඇති කෝණය, සෘජු කෝණයක් වේ.
AP සරල රේඛා ඛණ්ඩය ***l*** සරල රෙඛාවට ලම්බක යැයි කියනු ලැබේ.



(4) P ලක්ෂ්‍යයට ආසන්නයේ ම පිහිටි l සරල රේඛාව මත වූ ලක්ෂ්‍යය A බව නිරීක්ෂණය කරන්න. APහි දිග මැන ලියන්න.

AP සරල රේඛා ඛණ්ඩයේ දිග, P ලක්ෂ්‍යයේ සිට l සරල රේඛාවට ඇති **ලම්බ දුර** ලෙස හැඳින්වේ. AP දිග P ලක්ෂ්‍යයේ සිට l සරල රේඛාවට ඇති **කෙටිම දුර** ද වේ.

• සමාන්තර සරල රේඛා දෙකක් අතර ලම්බ දුර

l මත පිහිටි P සහ Q ලක්ෂ්‍ය දෙකේ සිට m රේඛාවට ඇති ලම්බ දුරවල් සමාන වේ. එනම්, $PA = QB$ වේ. එම නිසා l සහ m සරල රේඛා දෙක සමාන්තර වේ.



l සහ m සරල රේඛා සමාන්තර සරල රේඛා වේ.

a සරල රේඛාව මත පිහිටි R සහ S ලක්ෂ්‍ය දෙකේ සිට b සරල රේඛාවට ඇති ලම්බ දුරවල් අසමාන වේ.

එනම්, $RC \neq SD$ වේ. එම නිසා a සහ b සරල රේඛා සමාන්තර නොවේ.



a සහ b සරල රේඛා සමාන්තර සරල රේඛා නොවේ.

- සමාන්තර සරල රේඛා දෙකකින් එක් රේඛාවක පිහිටි ඕනෑ ම ලක්ෂ්‍යයක සිට අනෙක් රේඛාවට ඇති කෙටි ම දුර නියතයක් වේ. මෙම නියත දුර සරල රේඛා දෙක අතර **ලම්බ දුර** යැයි හැඳින්වේ. මෙම ලම්බ දුර සමාන්තර රේඛා අතර ඇති **පරතරය** ලෙස ද හැඳින්වේ.
- එකිනෙකට නියත දුරින් පිහිටි එක ම තලයේ වූ සරල රේඛා එකිනෙකට සමාන්තර ය.

නොමිලේ බෙදා හැරීම සඳහා ය.